# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2017 පෙබරවාරි මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2017.02.27 දින නිකුත් කරන ලදී)**

# සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

කෑගල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ)

**සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

පූර්විකාව.

"සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක්, එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී සංගමය සම්බන්ධ සියලු පරමාර්ථ හා කාරණා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් ද, එකී සංගමය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2017 අංක    දරන සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය සංස්ථාගත කිරීම.

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට හා ඉන්පසුව (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමයේ" දැනට සාමාජිකයන් වශයෙන් සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන්ද (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "සමස්ත ලංකා ඓතිහාසික දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය, තව ද, එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධවද නඩු පවරනු ලැබිය හැකි ය. තව ද, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, පාවිච්චි කිරීමේ ද, පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය එකී සංස්ථාවට තිබිය යුතු ය.

(2) 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ

එහි කාර්යය සඳහා සංස්ථාව ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, එම පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) දේවාල ආශ්‍රිත ඒ ඒ දේවාලයන්හි ආවේණික ඉපැරණි සම්ප්‍රදයන්/ සිරිත් විරිත්/ වත් පිළිවෙත්/ චාරිත්‍ර වාරිත්‍ර ආගමික කටයුතු ආරක්ෂා කොට ඉදිරියට පවත්වාගෙන යෑම සඳහා පියවර ගැනීම ;

(ආ) දේවාලවල පාරම්පරික නිලධාරීන්ගේ උරුම අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ මැදිහත්වීම;

(ඇ) යම් සාමාජිකයකුට නීතිමය හා වෙනත් අයුරකින් සිදුවන ගැටලුකාරී තත්ත්වයන්හි දී මැදිහත්කරුවකු ලෙස සංගමයේ සහයෝගය ලබාදීම;

(ඈ) සාමාජිකයන් අතර දැනුම හුවමාරු කර ගැනීම; සහ

(ඉ) දේවාල ආශ්‍රිත කටයුතුවල දී අවශ්‍ය අවස්ථාවල සංගමයක් ලෙස රජය සමග කටයුතු කිරීම.

**ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක කාර්ය සමග සංස්ථාවේ කාර්ය ගැටුම් සහගත නොවන බවට සංස්ථාව වගබලා ගත යුතු බව.**

4. ආණ්ඩුවේ හෝ පළාත් සභාවක යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්මේන්තුවක් විසින් සමගාමීව පවත්වාගෙන යනු ලබන යම් කාර්යයක් සහ සංස්ථාවේ කාර්යය අතර, කිසිදු ගැටුමක් නිර්මාණය නොවන ආකාරයෙන් සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කළ යුතු ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) මේ පනතේ විධිවිධානවලට යටත්ව සංස්ථාවේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය, මේ පනතේ 7 වැනි වගන්තිය යටතේ සාදනු ලබන සංස්ථාවේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි ධුර දරන්නන් යම් සංඛ්‍යාවකින් සමන්විත (මෙහි මින්මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භවන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලැබූ සංගමයේ මණ්ඩලය 7 වැනි වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම මණ්ඩලය පත් කරනු ලබන හෝ තෝරා පත් කරනු ලබන තෙක් සංස්ථාවේ මණ්ඩලය වශයෙන් ක්‍රියා කළ යුතු ය.

(ආ) සංස්ථාවේ ප්‍රථම මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයේ සිට එක් අවුරුද්දක කාලයක් ඇතුළත පත් කිරීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරු සහ උපදේශකවරු ඇතුළුව මණ්ඩලයේ සෑම ධුර දරන්නකුම වර්ෂ දෙකක කාලයක් සඳහා පත්කර ගත යුතු හෝ තෝරා පත්කර ගත යුතු අතර, ඒ වර්ෂ දෙකක කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ඒ ධුර දරන්නා අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත තෝරා පත්කර ගැනීම සඳහා සුදුස්සෙකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මියයාම, ඉල්ලා අස්වීම, නොහැකියාවකට පත්වීම හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයේ පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, මණ්ඩලය විසින් සංස්ථාවේ රීති සැලකිල්ලට ගෙන ඒ පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා පත්කර ගත යුතු හෝ පත්කර ගත යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලබන හෝ පත්කර ගනු ලබන හෝ තැනැත්තා ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

**සංස්ථාවේ බලතල.**

**6.** මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා පහත සඳහන් අවශ්‍ය හෝ අපේක්ෂිත සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ බලය සංස්ථාවට තිබිය යුතු ය:—

(අ) සංස්ථාවේ කාර්ය සඳහා අවශ්‍ය වන්නාවූ ඉඩම් හෝ ගොඩනැගිලි මිලට ගැනීමට, කුලියට ගැනීමට, ඉදිකිරීමට, අලුත්වැඩියා කිරීමට සහ සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සුදුසු යැයි සැලකෙන අයුරින් ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම, රැස්කිරීම සහ මුදල් හෝ ද්‍රව්‍යවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාව වෙත ලබා දෙනු ලබන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතිය ලබාගත යුතු ය;

(ඇ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීමට, ලිවීමට, භාර ගැනීමට, වට්ටම් දීමට, පිටසන් කිරීමට, ගනුදෙනු කිරීමට, මිලට ගැනීමට, විකිණීමට සහ නිකුත් කිරීමට සහ යම් බැංකුවක ගිණුම් විවෘත කිරීමට, ක්‍රියාත්මක කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට;

(ඈ) සංස්ථාවේ කාර්ය සඳහා වහාම අවශ්‍ය නොවන යම් අරමුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීමට;

(ඉ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව යම් නීත්‍යනුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීමට, පිළිගැනීමට, ක්‍රියාත්මක කිරීමට, ඉටු කිරීමට සහ පරිපාලනය කිරීමට;

(ඊ) සංස්ථාවේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම හෝ සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයෙහි විනය පාලනය පවත්වාගෙන යාම සහ සංස්ථාව විසින් තීරණය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීමට;

(උ) සංස්ථාවේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති දේශීය හා විදේශීය අනෙකුත් ආයතන සමඟ සම්බන්ධතා පවත්වාගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(එ) සංස්ථාවේ කාර්ය සඳහා ශ්‍රී ලංකාව තුළ හෝ විදේශයන්හි දී සේවක පිරිස් පුහුණු කිරීම.

7. (1) සංස්ථාව විසින් සංස්ථාවේ යම් මහ සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් මේ පනතට හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන්නා වූ රීති, පහත සඳහන් සියලු කරුණු හෝ ඉන් කිසිවක් සඳහා කලින් කල සෑදීම නීත්‍යනුකූල විය යුතු ය:— සංස්ථාවේ රීති.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම සහ සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු;

(ආ) මණ්ඩලයේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල කාර්ය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ පත් කිරීම්, නියම සහ කොන්දේසි, බලතල, කර්තව්‍ය හා කාර්ය;

(ඈ) මණ්ඩලයේ හෝ එහි යම් අනු කමිටුවක රැස්වීම් කැඳවීම්, කැඳවීමේ දී හා පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම්වල කටයුතු කරගෙන යාම;

(ඉ) සංස්ථාවේ සහ මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් සහ නුසුදුසුකම්;

(ඊ) සංස්ථාවේ දේපළ, පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම; සහ

(උ) පොදුවේ සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන්පත් කරගැනීම සහ සංස්ථාව විසුරුවා හැරීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් මේ වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

(4) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති රජයේ ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික නාම ලේඛනය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපින සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ නාම ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

සංස්ථාවේ අරමුදල.

**9.** (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු ය.

(2) සංස්ථාව සඳහා සහ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, ග්‍රාහක මුදල්, දයක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන සියලුම මුදල්, මණ්ඩලය විසින් අනුමත කරන ලද එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදම් පියවීමට අවශ්‍ය සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් සහ විගණනය.

**10.** (1) සංස්ථාවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) සංස්ථාව විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාවේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාවේ ගිණුම් විගණකාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර විගණකාධිපතිවරයා විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා 'සුදුසුකම් ලත් විගණකවරයා' යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක් ; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි ගණකාධිකාරි සමාගමක්,

අදහස් වේ.

වාර්ෂික වාර්තාව.

**11.** (1) මණ්ඩලය විසින් සෑම මුදල් වර්ෂයක් සඳහාම සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්තාවක් සකස් කරනු ලැබිය යුතු අතර, එම වාර්තාව විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශය සමඟ ඒ වාර්තාව අදාළ වන වසරට පසුව එන වර්ෂයේ සය මාසයක් ඉකුත්වීමට පෙර බුද්ධ ශාසන හා ආගමික කටයුතු විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හා 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) මුදල් වර්ෂය තුළ දී සංස්ථාව වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුමක් (1) වැනි උපවගන්තියේ සඳහන් වාර්තාව සමග යැවිය යුතු ය.

සංගමය විසින් ගෙවිය යුතු සහ සංගමයට අයවිය යුතු ණය මුදල්.

**12.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සංගමය විසින් ගෙවිය යුතු සියලු ණය හා බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර, එදිනට සංගමයට අයවිය යුතු සියලු ණය සහ සංගමයට ගෙවිය යුතු සාමාජික මුදල් සහ දයක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**13.** යම් මිළට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට මේ පනතේ විධිවිධානවලට යටත්ව නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වැනි වගන්තිය යටතේ සාදන ලද සංස්ථාවේ රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

මුදල් සහ දේපළ අදාළ කර ගැනීම.

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාවේ මුදල් හා දේපළ සංස්ථාවේ පරමාර්ථ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාවේ සාමාජිකයන්ට ලාභාංශ මුදල් ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් ඍජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**15.** (1) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, ඔවුන් දෙදෙනා තමන් පැමිණ සිටින බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කළ යුතු ය. ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි මණ්ඩලයේ යම් ධුර දරන්නකු භාරයේ තිබිය යුතු ය.

විසුරුවා හැරීමේ දී ඉතිරිවන දේපළ.

**16.** (1) සංස්ථාව විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය සහ බැරකම් පියවීමෙන් පසු යම් දේපළක් ඉතිරි වී තිබුණහොත් ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදීම තහනම් කරනු ලබන්නා වූ ද වෙනත් යම් ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වැනි උපවගන්තියේ කාර්ය සඳහා උචිත ආයතනය සංස්ථාව විසුරුවා හැරීමට පෙරාතුවම සංස්ථාවේ සාමාජිකයන් විසින් එහි යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**17.** ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**18.** මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.